ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2003 අංක 1 දරන ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2003 ජනවාරි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 ජනවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 8.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

2003 අංක 1 දරන ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2003 ජනවාරි මස 06 වන දින.]

එල්. ඩී.–ඕ. 29/2002.

ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංවර්ධන සභාව, එකී සංවර්ධන සභාවේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීති අනුව, එකී සංවර්ධන සභාව හා සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංවර්ධන සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සභාව විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී සංවර්ධන සභාව සංස්ථාගත කරන ලෙස ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 2003 අංක 1 දරන ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසුව, (මෙහි මින් මතු "සංවර්ධන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

ථාවේ
ද
ාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) බුද්ධාගම හා සම්බන්ධ විෂයයන් අධ්‍යයනය හා පර්යේෂණ කිරීමට අනුග්‍රහය දැක්වීම ;

(ආ) බුද්ධ ධර්මය හා සාරධර්ම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ඉගැන්වීම සහ බුද්ධ ධර්මය හා බෞද්ධ සාරධර්මවලට අනුකූලව ඔවුන්ගේ ජීවිත ගෙනයාමට උනන්දු කරවීම සහ බෞද්ධ ධර්මය ඉගැන්වීම පිණිස අධ්‍යාපනික ආයතන පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ;

(ඇ) බෞද්ධ උත්සව, චාරිත්‍ර විධි, වත් පිළිවෙත්, ව්‍යවහාරයන් හා සම්ප්‍රදායයන් වැඩි දියුණු කිරීම, පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම සහ විහාර, ආශ්‍රම, පිළිම, භාවනා මධ්‍යස්ථාන සහ අනෙකුත් සිද්ධස්ථාන පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ;

(ඈ) සමාජයේ සෑම කොට්ඨාසයක් සඳහා ම අධ්‍යාපන පහසුකම් හා සේවා සැපයීම සහ ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, ත්‍යාග, සහතික හා වෙනත් ප්‍රදානයන් ලැබීමට අවශ්‍යතා සම්පූර්ණ කරන පුද්ගලයන්ට එකී ප්‍රදානයන් කිරීම ;

(ඉ) භික්ෂූන් වහන්සේලාට ධර්ම ප්‍රචාරය සඳහා අවශ්‍ය පුහුණුව ද ඇතුළුව අනිකුත් පුහුණු කිරීම් වැඩි දියුණු කිරීම ;

(ඊ) සමාජයේ ආගමික, සාමාජික, ජනවාර්ගික සහ ජාතීන් අතර සමාදානය ඇති කිරීම හා පෝෂණය කිරීම ;

(උ) අනාථ, ආබාධිත, දුබල, මහළු, ගිලන් හා අවතැන් පුද්ගලයන් සඳහා සුභසාධක, පුහුණු හා පුනරුත්ථාපනය සඳහා මධ්‍යස්ථාන හා ආයතන ඇති කිරීම හා පවත්වා ගෙන යාම සහ සමාජ හා සුභසාධන පහසුකම් සැපයීම ;

(ඌ) පුස්තකාල, තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ;

(එ) තරුණ තරුණියන්ට තාක්ෂණ දැනුම ලබාදීම අරමුණු කොට ගෙන යම් කර්මාන්තයක හෝ වෘත්තියක සහභාගී කරවීම ; තාක්ෂණ හා කාර්මික ව්‍යවසායන් පිහිටුවීම ; එවැනි ව්‍යවසායන්හි යෙදීම සඳහා යම් තැනැත්තකුට ආධාර කිරීම හා සහාය වීම සහ එවැනි යම් කර්මාන්තයක හෝ වෘත්තියක පුහුණු වැඩ පිළිවෙලවල් පවත්වා ගෙන යාම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීමෙහි ලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපනය, විවාද, සම්මේලන හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සංවිධාන හෝ සමිති සමග සහයෝගයෙන් හෝ සම්බන්ධව ක්‍රියා කිරීම ; සහ

(ඕ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කිසිවක් සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවෙහි කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව හා එකී රීතිවලට අනුකූලව එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරුන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත, පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට ඉහතින් වූ දිනයේ ධුර දැරූ සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රථම මණ්ඩලය විය යුතු අතර, ඒ මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන තෙක් ධුර දරන්නේ ය.

සාමාජිකත්ව නාම ලේඛනය.

5. (1) මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකු වූ ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ ඉන් පසු යථා පරිදි ඇතුළත් කර ගනු ලබන්නා වූ ද, සෑම සාමාජිකයකුගේම නම ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) නාම ලේඛනයෙහි පහත සඳහන් විස්තර, එනම් :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා රක්ෂාව ;

(ආ) සාමාජිකයාගේ නම, නාමලේඛනයෙහි ඇතුළත් කරන ලද දිනය ;

(ඇ) යම් සාමාජිකයකු සාමාජිකයකු වීම අවසන් වූ දිනය,

ඇතුළත් විය යුතු ය.

සංස්ථාවේ බලතල.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැඟිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) මුදල් ණයට ගැනීමට හා දේශීය හෝ විදේශීය කවර හෝ ප්‍රභවයකින් මුදලින් හෝ වර්ගයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම ;

(ඇ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් කරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ යම් බැංකුවක, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වා ගෙන යාමට හා ඒ ගිණුම් වසා දැමීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යනුකුල භාර කිසිවක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ; සහ

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙහි සේවක පිරිස් පුහුණු කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

7. (1) සංස්ථාව විසින් යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) මණ්ඩලය තෝරා පත් කර ගැනීම, අධ්‍යක්ෂවරුන් විසින් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හා චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් සේවයෙන් නෙරපීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය, චර්යාව සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒවායේ පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට ඉහතින්ම වූ දිනයේ දී බලාත්මකව පැවති සංවර්ධන සභාවේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන අන්දමට ම එවැනි ම රැස්වීමක දී හා එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් වන්නා හ.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්ථවරණ පැවරීම, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම උදෙසා සංස්ථාව විසින් යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කවර හෝ ආකාරයකින් ලබා ගනු ලැබුව ද, සංස්ථාවේ මුදල් හා දේපළ හුදෙක් මෙහි දක්වා ඇති පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම අරභයා යොදා ගනු ලැබිය යුතු අතර, ඒ මුදල්වලින් හෝ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත, කෙළින් ම හෝ නොඑසේව, ලාභාංශ හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම, කරනු නොලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

9. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංවර්ධන සභාව විසින් ගෙවිය යුතු හෝ සභාවට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංවර්ධන සභාව විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංවර්ධන සභාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංවර්ධන සභාවට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. විධායක අධ්‍යක්ෂ සහ භාණ්ඩාගාරිකවරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනාම ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

14. සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

"ඒ" ස්ථාවර කාරක සභාව

2002 නොවැම්බර් මස 21 වන බ්‍රහස්පතින්ද ප.ව. 2.30 ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අංක 08 දරන කාරක සභා කාමරයේ දී පවත්වන ලද "ඒ" ස්ථාවර කාරක සභාවේ කාර්ය සටහන් :

පැමිණ සිටි මන්ත්‍රීන් :

ගරු සිරි අන්ද්‍රාහැන්නදි මහතා (සභාපති)
ගරු රවින්ද්‍ර සමරවීර මහතා
*ජයන්ත කැටගොඩ මහතා
ජයන්ත ජයවීර මහතා
ඩී. පී. ඩී බණ්ඩාරනායක මහතා
අර්ජුන රණතුංග මහතා
දිලිප් වෙදආරච්චි මහතා
උපාලි සමරවීර මහතා
පූජ්‍ය බද්දේගම සමිත ස්ථවිර
සුනිල් හඳුන්නෙත්ති මහතා

*පනත් කෙටුම්පත් යෝජක

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 117 දරන ස්ථාවර නියෝගය යටතේ දැනුම්දීම ප්‍රකාරව කාරක සභාව රැස්විය.

2. ශ්‍රී නාරද බෞද්ධ මධ්‍යස්ථාන විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ අදාල ඇමතිවරයාගේ වාර්තාව කමිටුව සිය අවධානයට යොමු කරන ලදී.

1 සිට 16 දක්වා වගන්ති සභා සම්මත විය.

පූර්විකාව සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය සභා සම්මත විය.

3. පනත් කෙටුම්පත අවශ්‍ය ආනුෂංගික සංශෝධනය කිරීමට සහ පනත් කෙටුම්පත අංක ගත කිරීමට කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය පවරන ලදී.

4. "පනත් කෙටුම්පත කාරක සභාවේ කාර්ය සටහන් සමග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5. කාරක සභාව ප. ව. 2.45 ට විසිර ගියාය.

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පතත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.